// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2151/51 – 2019 නොවැම්බර් 28 වැනි බ්‍රහස්පතින්දා – 2019.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය:* අයිආර්/සීඕඑම්/03/2019/78.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මිය, අංක 121/11, බන්ධනාගාර නිල නිවාස, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති

බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කොහොම්බන් වත්ත,අංක 66/2ඒ, එච්.ආර්.එල්.සුගතදාස මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: අයිආර්/සීඕඑම්/03/2019/78.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*
එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මිය, අංක 121/11, බන්ධනාගාර නිල නිවාස, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 1998.08.03 දින සිට VI වන ශ්‍රේණියේ උසාවි ලිපිකාරිණියක් ලෙස පත්වීම් ලද එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මහත්මිය වර්තමානය දක්වා ම උසස්වීම් නොලබා සේවය කිරීම නිසා ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඇයට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ'' .

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12- 462

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.